# 13

# ගුරුන්ට සළකමු

ජාහිලිය්යා නම් ඒ යුගය විය
ලොව මිනිසා අඳුරෙහි පසුවිය
නැණ පහන දැල්වනු පිණිසමය
ලොව වැඩියේ අප නබිතුමන්ටය



නබි වරු හැර ගියේ ලොවේ
රන් රිදී හෝ අන් දේට නොවේ
දැනුමයි  ප්‍රඥාවයි මෙලොවේ
දන්නේ දරුවන් හැම දෙනා නොවේ

දැසෙහි එළිය ලැබුවෝ
ලද්දෝය දැනුම ලැබුවෝ
විදුන්ගේ එබස් ඇසුවෝ
වන්නෝය සොඳුරු දරුවෝ

තමන් දැනුම ලැබ නොමඳා
දුනහොත් අන් අයට ද බෙදා
ලබයි දායාද රබ්ගෙන්  සැමදා
කීහ නබිතුමන් හොඳින් පහදා

සිසුනට නිබඳව දූනුම බෙදා දෙන
මවුනගේ ගුණ නැණ නිතරම වඩවන
රට දූය වැඩුමට නිති මඟ පෙන්වන
උතුමෙකි ගුරුවරයා යැයි නම් වන

දියෙහි පිහිනා යන මත්ස්‍යයනුත්
අහස  පීරා යන කුරුල්ලනුත්
පොළව මත දුවනා සිව්පාවනුත්
මලක් කියනා සුර දූතයනුත්

පතයි සැම (දන) ඥාන ලැබුමට
විදුන් වන අප ගුරුනට
පතමු එලෙසින් අපද ඔවුනට
සළකා ගුරුන් ඉස් මුදුනින් අද සිට

දනී ද ජාති ආගම් කුල භේදා
විදුන් වන අප ගුරුන් කිසි දා
දෙමින් හැකි ගරු බුහුමන් සැම දා
පතමු සැම රහ්මත් මුළු හදින් නිබඳා

දැනුම ලබා නැණවත් දැනුමෙන් පිරී වෙසෙන්නා
නබි පරපුර වෙත උරුම කියන්නා
ඒ ලෙස නබි උතුමා පවසන්නා
එය පිළිපැද ඔබ පෙරටම යන්නා

අල්ලාහ් අප වෙත සතුටින් දෙන ලද
මහඟු තිළිනයකි ගුරුවරු හැම සඳ
ඔවුනට බැති සිත සුදමින් නිසි ලෙද
අයදිමු ගුරු කැල රැක දෙනු හැම සඳ



## අභ්‍යාස

**පහත සඳහන් අදහස් නිවැරදි නම් 'හ' යැයි ද වැරදි නම් 'වැ' යයි ද සඳහන් කරන්න**

1. ඉස්ලාමයේ ප්‍රථම ගුරුවරයා මුහම්මද් (සල්) තුමා ය. ( )
2. නබි වරුන් ලොවට හැර ගිය දේපල රන් රිදී හා ද්‍රව්‍ය වන්නේ ය. ( )
3. අල් කුර්ආනය අධ්‍යාපනය වර්ණනා කරන්නේ දෑස් කියා ය. ( )
4. නබිවරුන්ගෙන් පැවත එන්නන් විද්වතුන් යනු කුර්ආනයේ අදහසයි. ( )
5. ගුරුවරුනට ගරුබුහුමන් කිරීම යහපත් ආනිසංස ගෙන දෙයි. ( )
6. ගුරුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම ඔහුට ගරු කිරීමක් වන්නේ නැත. ( )
7. ලොව ශ්‍රේෂ්ඨ පුද්ගලයා ධනවතා ය. ( )

ක්‍රියාකාරකම

මෙම ගීතය තාලයට ගායනා කරන්නට යොමු කරන්න